# 03. සම්මොදමානජාතකං

## තතියො පාඨො



අථෙක දිවසං <u>බොධිසත්තො</u> තෙ වට්ටකෙ ආහ. අයං සාකුණිකො අම්හාකං ඤාතකෙ විනාසං <u>පාපෙති.</u> අහං එකං උපායං ජානාමි, යෙනෙස අම්හෙ ගණ්හිතුං න සක්ඛිස්සති. ඉතොදානි පට්ඨාය එතෙන තුම්හාකං උපරි ජාලෙ ඛිත්තමත්තෙ එකෙකො එකෙකස්මිං ජාලක්ඛිකෙ සීසං ඨපෙත්වා ජාලං උක්ඛිපිත්වා ඉච්ඡිතට්ඨානං හරිත්වා එකස්මිං කණ්ඨකගුම්බෙ පක්ඛිපථ. එවං සන්තෙ හෙට්ඨා තෙන තෙන ඨානෙන පලායිස්සාමාති. තෙ සබ්බෙ සාධූති පටිස්සුණිංසු.

**(ජාතකට්ඨකථා සම්මොදමානජාතකං)**

**(කියවීමේ හුරුවට පමණි.)**

## විවිධ පද

**පාලි භාෂාවේ විවිධ පද හඳුනා ගනිමු.**

පද යනු භාෂාවේ යෙදෙන අර්ථවත් කුඩා ම ඒකකය යි. පදයක් යනු තනි අකුරක් හෝ අකුරු සමූහයකි.

1. පද වර්ග හතරකි.

   නිදසුන් :-

   නාම පද - චන්‍දෙ (සඳ)  නිපාත පද - ච (ද)

   ක්‍රියා පද - ගච්ඡති (යයි)  උපසර්ග පද - උප (ළඟ / දෙවැනි)

- නාම පද පුරුෂ හා වචන වශයෙන් බෙදා වෙන්කළ හැකි ය.
  1. ලිංග තුනකි (3) - පුල්ලිඞ්ග, ඉත්ථිලිඞ්ග, නපුංසකලිඞ්ග
  2. පුරුෂ තුනකි (3) - පඨම පුරිස, මජ්ඣිම පුරිස, උත්තම පුරිස
  3. වචන දෙකකි (2) - ඒකවචන, බහුවචන
- නාමපද - නාම ප්‍රකෘතියකට විභක්ති ප්‍රත්‍යයක් එක් කිරීමෙන් නාමපදයක් සෑදෙයි.

උදා - 1. බුද්ධ + ඔ = බුද්ධො  2. කුමාර + ඔ = කුමාරො

3. ධම්ම + ඔ = ධම්මො  4. දෙව + ඔ = දෙවො

- ක්‍රියාපද - ධාතුවකට (ක්‍රියාවේ මුල් ස්වභාවයට) ආඛ්‍යාත ප්‍රත්‍යයක් එක් කිරීමෙන් ක්‍රියාපදයක් සාදාගත හැකි ය.

උදා - 1. පච + ති = පචති  2. වන්‍ද + ති = වන්‍දති

3. හස + ති = හසති  4. ධාව + ති = ධාවති

## අභ්‍යාසය 03 1

1. පාලි භාෂාවේ පද වර්ග නම් කරන්න.
2. නාම පද හා ක්‍රියා පද පහ බැගින් ලියන්න.
3. පාඩම කියවා එහි ඇති ක්‍රියා පද පහක් ලියන්න.

- නාම (ශබ්ද) විභක්ති 9ක වරනැගෙයි. එම විභක්ති මෙසේ ය.

පඨමා විභක්තිය | ආලපන විභක්තිය | දුතියා විභක්තිය
තතියා විභක්තිය | කරණ විභක්තිය | චතුත්‍ථී විභක්තිය
පඤ්චමී විභක්තිය | ඡට්ඨී විභක්තිය | සත්තමී විභක්තිය

- ක්‍රියා පද ප්‍රධාන කාල තුනකට බෙදෙයි.

1. අතීත කාල  2. වර්තමාන කාල  3. අනාගත කාල

මේ පහත සඳහන් නාම පද වගුව කියවා පුහුණුවන්න.

| නාමපද | | | | | | |
|---|---|---|---|---|---|---|
| පුරිස | පුලලිඞගනාම | | ඉත්ථිලිඞගනාම | | නපුංසකලිඞගනාම | |
| | ඒකවචන | බහුවචන | ඒකවචන | බහුවචන | ඒකවචන | බහුවචන |
| පඨම | බුද්ධො - බුදුරජ | බුද්ධා - බුදුවරු | මාලා - මල්දම | මාලායො - මල්දම් | චිත්තං - සිත | චිත්තානි - සිත් |
| | පිතා - පියා | පිතරො - පියවරු | පූජා - පූජාව | පූජායො - පූජා | පුඤ්ඤං - පින | පුඤ්ඤානි - පින් |
| | භාතා - සහෝදරයා | භාතරො- සහෝදරයෝ | මාතා - මව | මාතරො - මව්වරු | ඵලං - ගෙඩිය | ඵලානි - ගෙඩි |
| | භික්ඛු - භික්ෂුව | භික්ඛ වො - භික්ෂූහු | නාවා - නැව | නාවායො - නැව් | සොතං - කන | සොතානි - කන් |
| | රාජා - රජ | රාජානො - රජවරු | වාචා - වචනය | වාචායො - වචන | දානං - දානය | දානානි - දන |
| | කලඤ්ඤකො - ලේනා | කලඤ්ඤකා - ලේන්නු | භරියා - භාර්යාව | භරියායො - භාර්යාවෝ | පදුමං - පියුම | පදුමානි - පියුම් |
| | ව්‍යාධො - වැද්දා | ව්‍යාධා - වැද්දෝ | වනිතා - ස්ත්‍රිය | වනිතායො - ස්ත්‍රීහු | පීඨං - පුටුව | පීඨානි - පුටු |
| | කවි - පණ්ඩිතයා | කවයො - පණ්ඩිතයෝ | බාලිකා - බාලිකාව | බාලිකායො - බාලිකාවෝ | වනං - වනය | වනානි - වන |
| | මහාසයො - මහත්මයා | මහාසයා - මහත්වරු | දාරිකා - දූරිය | දාරිකායො - දූරියෝ | පණ්ණං - කොළය | පණ්ණානි - කොළ |
| | අරි - සතුරා | අරයො - සතුරෝ | දොලා - ඔංචිල්ලාව | දොලායො - ඔංචිල්ලා | නයනං - ඇස | නයනානි - ඇස් |
| | සර්වනාම | | | | | |
| | සො - ඔහු | තෙ - ඔවුහු | සා - ඈ | තායො - ඈලා | තං - එය | තානි - ඒවා |
| | අයං - මොහු | ඉමෙ - මොවුහු | ඉමා - මෑ | ඉමායො - මෑලා | ඉදං - මෙය | ඉමානි - මේවා |
| | කො - කවුද | කෙ - කවරහු ද | කා - කවර තැනැත්තියක් ද | කායො - කවර තැනැත්තියෝ ද | කං - කුමක් ද | කානි - මොනවා ද |
| | යො - යමෙක් | යෙ - යමෙක්හු | යා - යම් තැනැත්තියක් | යායො - යම් තැනැත්තියෝ | යං - යමක් | යානි - යම් ඒවා |
| මජ්ඣිම | ත්වං - නුඹ | තුමෙහ - නුඹලා | | | | |
| උත්තම | අහං - මම | මයං - අපි | | | | |